**ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව - 2017**

**-----------------------------------------------**

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහාවූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29 වන වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සංස්ථාවේ සභාපති වෙත 2018 ජුනි 21 දින  නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන  ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනයකළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනයකළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 පැහැදිලි නොකළ වෙනස්කම්**

මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමස්ත වෙළඳ ණයගැතියන්ගෙන් සියයට 90.55 ක් හෙවත් රු.9,267,922,705 ක් වෛද්‍ය සැපයීම් අංශයෙන් ලැබිය යුතුව තිබුණු නමුත් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම අනුව එම ශේෂය රු.9,049,836,862 ක් විය. ශේෂ සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර රු.218,085,843 ක් වූ වෙනසට හේතු හඳුනාගෙන ගිණුම්වල අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

2017 දෙසැම්බර් 31 දිනට ණයහිමියන් 210 දෙනෙකුට අදාළ රු.818,160,881 ක් වූ වෙළඳ ණයහිමි ශේෂයෙන්, ණයහිමියන් 106 කට අදාළ රු.48,844,761 ක ශේෂ තහවුරු කර ගැනීම සඳහා ශේෂ සනාථන විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

**2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෛද්‍ය සැපයීම් අංශයෙන් ලැබිය යුතු රු.9,267,922,705 ක ශේෂයෙන් රු.211,810,803 ක් වර්ෂ 8 ත් වර්ෂ 19 ත් අතර කාලයක් පැරණි ණය ශේෂ වූ අතර රු.9,056,111,902 ක ණය සඳහා කාල විශ්ලේෂණය විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සංස්ථාවේ ප්‍රතිපත්තිය අනුව, විකුණු දින සිට දින 30 ත් දින 45 ත් අතර කාලය තුළදී වෙළඳ ණයගැතියන්ගේ ණය අයකරගත යුතු වුවද, 2017 දෙසැම්බර් 31 දිනට වූ රු.967,042,539 ක ණය ශේෂයෙන් පුද්ගලික, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවලින් රු.12,327,940 ක් වර්ෂ 5 කට වැඩි කාලයක සිටද ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවෙන් රු.9,044,299 ක් වර්ෂයකට වැඩි කාලයක සිටද අයවිය යුතුව පවතින ණය අයකර ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි. ඉන් රු.10,440,049 ක ණය ශේෂ අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගෙන ඇති බව සංස්ථාවේ සභාපතිවරයා විසින් විගණනය වෙත දන්වා තිබුණි.

(ඈ) 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රක්ෂණ වන්දි රු.2,507,547 ක් වූ අතර ඉන් රු.1,835,198 ක් වර්ෂ 2 ත් වර්ෂ 12 ත් අතර කාලයක සිට අයකර ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට ආපසු ලබා ගත යුතු බහාලුම් තැන්පතු ගිණුමේ ශේෂය රු.11,769,850 ක් වූ අතර ඉන් රු.6,462,823 ක් වර්ෂ 2 ත් වර්ෂ 10 ත් අතර කාලයක සිට ආපසු අයකර ගැනීමට සංස්ථාව අපොහොසත්වී තිබුණි.

(ඉ) විදුලි ජනක යන්ත්‍රයක් අළුත්වැඩියා කිරීම වෙනුවෙන් 2013 වර්ෂයේදී නිකුත්කර තිබුණු රු.105,672 ක් වූ අත්තිකාරම් හා 2007 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ සැපයුම්කරුවන්ට නිකුත්කර තිබුණු රු.2,971,688 ක අත්තිකාරම් විගණිත දිනය වූ 2018 මාර්තු 22 දින වන විටත් පියවා නොතිබුණි.

(ඊ) 2017 දෙසැම්බර් 31 දිනට බැංකු වෙත ගෙවිය යුතු බිල්පත් ගිණුමේ ශේෂය රු.2,773,021,077ක් වූ අතර ඉන් රු.4,859,879 ක් වර්ෂ 3 කට වඩා පැරණි සැපයුම්කරුවන්ට නොගෙවූ සියයට සියයක ණයවර ලිපි වටිනාකම හා රැඳවුම් මුදල් වලින් සමන්විත වී තිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා පහත පරිදි විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 770 | (i) 2016 ජුනි 24 දින සිට වසා දමන ලද සංචාරක බංගලා 3 කට අයත් ස්ථාවර වත්කම් අයිතම 49 ක් පාවිච්චියට ගැනීමට හෝ පාවිච්චියට ගත නොහැකි නම් මුදල් රෙගුලාසි ප්‍රකාරව එම භාණ්ඩ සම්බන්ධයෙන් සමීක්ෂණ මණ්ඩලයක නිර්දේශ සහිතව ඒවා විකිණීමට හෝ අපහරනය කිරීමට කටයුතු කළ යුතු වුවද 2018 මැයි 03 දින වන විටත් ඒ අනුව කටයුතු නොකර සංස්ථාවේ බිම් මහලේ තබා තිබුණි. |
| | (ii) 2016 දෙසැම්බර් 31 දිනට සිදුකර තිබුණු භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව, පිරිවැය රු.1,322,750 ක්වූ අයිතම 117 ක් හා පිරිවැය දක්වා නොතිබුණු අයිතම 171 ක් හානිවී තිබුණද, මුදල් රෙගුලාසිය ප්‍රකාරව සමීක්ෂණ මණ්ඩලයක් පත්කර පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ හඳුනාගෙන විකිණීමට හෝ අපහරනය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2007 අගෝස්තු 24 දිනැති අංක 09/2007(1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය. | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන), නියෝජ්‍ය කළමනාකරු (නඩත්තු හා ඉදිකිරීම්), සුපරීක්ෂක යන තනතුරු සඳහා විශ්‍රාමික නිලධාරීන් සේවයේ යොදාගෙන තිබුණද අදාළ අමාත්‍යාංශ ලේකම්වරයාගේ පෞද්ගලික නිර්දේශය ලබාගෙන නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,089,431,741 ක ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු.1,241,744,631ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභයේ රු.152,312,890 ක පිරිහීමක් දක්නට ලැබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය වියදම් රු.29,989,320 කින් හෙවත් සියයට 461 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අඛණ්ඩ ශුද්ධ ලාභයක් ඇතිවී තිබුණද එය වාර්ෂිකව උච්චාවචනයවී තිබුණු අතර 2013 වර්ෂයේදී රු.777,218,094 ක් වූ ශුද්ධ ලාභය සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,560,027,058 ක් වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු.2,065,476,098 ක් වූ සංස්ථාවේ දායකත්වය උච්චාවචනයන් සහිතව 2017 වර්ෂයේදී රු.3,261,654,325ක් දක්වා වර්ධනය වී තිබුණු අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දායකත්වය සියයට 0.7 කින් අඩුවී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ද්‍රවශීලතා අනුපාතවල පිරිහීමක් නිරීක්ෂණය වූ අතර ණයගැති පිරිවැටුම් අනුපාතය වාර 1.7 කින් අඩුවී තිබුණු අතර ණය ආපසු අයකර ගැනීමේ කාලය දින 31කින් වැඩි වී තිබුණි. ඒ පිළිබඳ අවධානය යොමු කරමින් සංස්ථාවේ ණය අයකර ගැනීමේ මෙහෙයුම් කටයුතු කාර්යක්ෂම කර ගත යුතු වන බව නිරීක්ෂණය විය.

### 3.3 සංස්ථාවට එරෙහිව හෝ සංස්ථාව විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

බාහිර ආයතන හා නිළධාරීන් විසින්, අසාධු ලේඛනගත කිරීම, තනතුරින් පහත දැමීම, තනතුරින් ඉවත් කිරීම යන කරුණු මත සංස්ථාවට එරෙහිව අධිකරණවල නඩු 04 ක් සහ සංස්ථාව විසින් බාහිර ආයතන 05 කට එරෙහිව එකතුව රු.23,372,660ක වන්දි ඉල්ලා අධිකරණවල නඩු 05 ක් ගොනුකර තිබුණි.

### 3.4 වියදම්වල අසාමාන්‍ය වැඩිවීම

ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ බැංකු අයිරා පොලී වියදම පිළිවෙලින් රු.5,434,349 ක් හා රු.35,199,403 ක් වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ එම වියදම සියයට 548 කින් වැඩිවී තිබුණි. වෛද්‍ය සැපයුම් අංශය වෙත සැපයුම් ප්‍රමාණය වැඩිවී තිබුණද, ඒ සඳහා මුදල් ලැබීමේ ප්‍රමාදයන් හේතුවෙන් බැංකු අයිරා පහසුකම් වැඩි කර ගැනීම ඊට හේතුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 සැලසුම් කිරීම

සංස්ථාව පිහිටුවීමට අදාළ 1971 සැප්තැම්බර් 22 දිනැති අංක 14,976/8 දරන ලංකාණ්ඩුවේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කර තිබුණු සියුම් රසායන ද්‍රව්‍ය නිපදවන කර්මාන්ත පිහිටුවීම හා ඒවාට අනුග්‍රහ දැක්වීම සහ ඖෂධ අලෙවිය පිළිබඳ ලංකාවේත් විදේශ රටවලත් පර්යේෂණ කටයුතු ඇරඹීම යන ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට හැකිවන පරිදි සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් පහත සඳහන් ක්‍රියාකාරකම් ඉටුකරගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි.

(i) ඖෂධ ආනයනයේදී අතරමැදියන් නොමැති ඍජු ආනයනය සඳහා ක්‍රමවේදයක් සැකසීම
(ii) සංස්ථාවේ සියලු මෙහෙයුම් අංශ සම්බන්ධීකරණය කිරීම වෙනුවෙන් ක්‍රියාත්මක කළ ව්‍යාපාර සම්පත් සැලසුම්කරණ පද්ධතියෙහි අවසන් ස්ථාපනය (Final Installation), පද්ධති පුහුණුව (System Training), සමාන්තරව ක්‍රියාත්මක කිරීම (Parallel Run) හා පද්ධතියේ මෙහෙයුම් පිළිගැනීම (Operational acceptance of the system) යන අදියරයන් ක්‍රියාත්මක කිරීම
(iii) ව්‍යාපාර සම්පත් සැලසුම්කරණ පද්ධතිය බාහිර පද්ධති සමග සම්බන්ධීකරණය කිරීම
(iv) ව්‍යාපාර තිර සැලැස්ම වැඩිදියුණු කිරීම (Upgrade Business continuity plan)
(v) නව නිෂ්පාදන ඇතුළත් කිරීම සඳහා නිෂ්පාදන සැලැස්ම සංවර්ධනය කිරීමට අදාළව කාර්ය මණ්ඩල පුහුණුව, ප්‍රසම්පාදන සැලසුම් කිරීම හා නිෂ්පාදන ආරම්භ කිරීම යන කටයුතු
(vi) රසායනාගාර පහසුකම් පුළුල් කිරීම සඳහා ඉදිකිරීම් පහසුකම් වැඩි දියුණු කිරීම
(vii) නවීන හා අත්‍යාවශ්‍ය උපකරණ සමග රසායනාගාරය වැඩිදියුණු කිරීම
(viii) බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කිරීම
(ix) පොදු පහසුකම් වැඩිදියුණු කිරීම යටතේ නඩත්තු අංශය ශක්තිමත් කිරීම

මෙම ක්‍රියාකාරකම් අතුරින් අංක (ii) හා (viii) ක්‍රියාකාරකම් 2015 වර්ෂයේ සිට ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

2000 සැප්තැම්බර් 19 වන දින සංස්ථාව විසින් බදුල්ල මහ නගර සභාව සහ නාගරික සංවර්ධන අධිකාරිය සමග ඇති කරගත් බදු ගිවිසුමක් මගින් බදුල්ල බස් නැවතුම්පල වෙළඳ සංකීර්ණයේ ඇති ගොඩනැගිල්ලක් බද්දට ගෙන රාජ්‍ය ඔසුසලක් ආරම්භ කර තිබුණද 2011 නොවැම්බර් 17 දින ඔසුසල එම ගොඩනැගිල්ලෙන් ඉවත්කර 2013 ජනවාරි 15 දින සිට පස් අවුරුදු කාලයකට මාසිකව රු.55,000 ක් බැගින් වූ මුදලකට වෙනත් පාර්ශවයක් වෙත බදු දී තිබුණි. ඒ සඳහා ඇතිකර ගෙන තිබුණු ගිවිසුම ප්‍රකාරව බදු ගැණුම්කරු මාස 03 ක කාලයක් බදු මුදල් නොගෙවුවහොත් බදු ගිවිසුම අවලංගු කිරීමට බදු දීමනාකරුට අයිතිය පැවතුණද 2013 සැප්තැම්බර් 05 න් පසුව මාස 09 ක කාලයක් තිස්සේ බදු ගැණුම්කරු විසින් බදු මුදල් ගෙවීම පැහැර හැර තිබුණු නමුත් සංස්ථාව විසින් බදු ගිවිසුම අවලංගු කිරීමට කටයුතු කර නොතිබුණි. බදු මුදල් නොගෙවීම සම්බන්ධයෙන් සංස්ථාව විසින් කරන ලද දැනුවත් කිරීම් හේතුවෙන් බදු ගැණුම්කරු විසින් වරින් වර රු.1,890,000 ක් සඳහා චෙක්පත් සහ මුදල් ලබාදී තිබුණද ඉන් රු.1,330,000 ක් වටිනා චෙක්පත් අගරු වී තිබුණු අතර විගණිත දිනය වූ 2018 මාර්තු 21 දින වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණු මුළු හිඟ බදු මුදල රු.2,003,320 ක් විය.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට මාර්ගස්ථ තොග ගිණුමේ කාල විශ්ලේෂණයට අනුව පිරිවැය රු.44,621,916 ක් වූ තොග මාස හයකට වඩා වැඩි කාලයක් ද, පිරිවැය රු.7,574,513 ක් වූ තොග වර්ෂයකට වඩා වැඩි කාලයක් ද මාර්ගස්ථ තොග ලෙස පවතින බව තහවුරු විය. වෛද්‍ය සැපයුම් අංශය විසින් භාරගත් තොග වෙනුවෙන් හරපත් නිකුත් කිරීමේ ප්‍රමාදය සහ වෛද්‍ය සැපයුම් අංශය භාර නොගත් තොග භාර නොගැනීමට හේතු සොයා බලා පිළියම් නොයෙදීම හේතුවෙන් එම තොග දීර්ඝ කාලයක් තිස්සේ මාර්ගස්ථ තොග ලෙස පැවතුණි.

(ආ) සංස්ථාවේ අලෙවිය සඳහා මිලදී ගෙන තිබුණු නමුත් ඉකුත් වර්ෂයේදී තත්ත්වයෙන් අසමත් හා කල්ඉකුත්වූ ඖෂධවල මුළු පිරිවැය පිළිවෙලින් රු.110,007,776 ක් හා රු.19,980,259 ක්වූ අතර සමාලෝචිත වර්ෂයේදී තත්වයෙන් අසමත් හා කල්ඉකුත්වූ ඖෂධවල පිරිවැය පිළිවෙලින් රු.23,561,218 ක් හා රු.80,834,686 ක් විය. ඉකුත් වර්ෂයට හා සමාලෝචිත වර්ෂයට අදාළ තත්ත්වයෙන් අසමත් ඖෂධවල මුළු පිරිවැය රු.133,568,994 කින් රු.26,603,418 ක් 2018 මාර්තු 26 දින වන විටත් අදාළ ඖෂධ සැපයුම්කරුවන් වෙතින් අයකරගෙන නොතිබුණු අතර ඖෂධ කල්ඉකුත්වීම නිසා සංස්ථාවට දැරීමට සිදුවී තිබුණු මුළු අලාභය රු.89,973,349 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ පැවති ක්‍රියාකාරී ඔසුසල් 37 අතරින් ඔසුසල් 19 ක් අලාභ ලබා තිබුණු අතර මුළු අලාභය රු.41,286,421ක් විය. අවිස්සාවේල්ල, මීනුවන්ගොඩ, දියතලාව, තංගල්ල, හම්බන්තොට, යාපනය හා රත්මලාන යන නගරවල පිහිටි ඔසුසල් 7 ක් 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම අඛණ්ඩව අලාභ ලබා තිබුණි. අලාභ අවම කර ගැනීමට වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ මුළු අලාභයෙන් සියයට 37.54 ක් එම ඔසුසල් 7 න් ලබා තිබුණි.

(ඈ) වෛද්‍ය සැපයුම් අංශයට තත්ත්වයෙන් අසමත් හා හානි වූ ඖෂධ සපයා තිබීම සහ ඖෂධ අඩුවෙන් සපයා තිබීම වෙනුවෙන් දරන ලද පිරිවැය, පරිපාලන ගාස්තු හා එම තොග විනාශ කිරීමේ වියදම් සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීම සඳහා 2017 දෙසැම්බර් 31 දින වන විට නිකුත් කරන ලද හරපත්වල වටිනාකම රු.1,303,740,147 ක්වූ නමුත් ඉන් රු.579,996,167 ක් අයකර ගැනීමට අපොහොසත්වී තිබුණු අතර ඒ තුළ වූ රු.104,803,706 ක් අසාධු ලේඛනගත සැපයුම්කරුවන් ගෙන් අයකර ගත යුතු වූ බැවින් එම අයකිරීම් අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි.

(ඉ) Ascorbic Acid Tablets BP/USP 100mg ඖෂධයෙන් ඒකක 60,000 ක් ඒකක 30,000 බැගින් කාණ්ඩ දෙකක් යටතේ මිලදී ගෙන තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2014 නොවැම්බර් 15 දින මෙම ඖෂධයේ පළමු ඒකක 30,000 සංස්ථාවට ලැබී තිබුණු අතර ඉන් ඒකක 25,450 ක් තත්ත්වයෙන් අසමත් බව හඳුනා ගත් අවස්ථාව වන විට ඉන් ඖෂධ ඒකක 18,326 ක් රෝගීන් වෙත විකුණා තිබුණි. ඖෂධ ඒකක 3,446 ක් සැපයුම්කරු විසින් නැවත සපයා තිබුණු නමුත් ඉතිරි ඒකක 22,004 ට අදාළ පිරිවැය රු.11,687,205 ක් හා ඉන් සියයට 25 ක් වූ රු.2,921,801 ක දඩ මුදලක් සැපයුම්කරුගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) පළමු ඖෂධ ඒකක 30,000 න් ඒකක 25,450 ක්ම තත්ත්වයෙන් අසමත්වී තිබුණු බැවින් දෙවන ඒකක 30,000 අවලංගු කිරීමට කටයුතු කර නොතිබුණි. තත්ත්වයෙන් අසමත් ඒකක 22,004 කට අදාළ රු.14,609,006 ක් අයකරගෙන නොතිබියදී දෙවන ඒකක 30,000 වෙනුවෙන් සම්පූර්ණ මුදලම සැපයුම්කරු වෙත ගෙවා තිබුණි.

(iii) 2015 සැප්තැම්බර් 11 දින ලැබී තිබුණු දෙවන ඒකක 30,000 න් ඒකක 1,500 ක් තත්ත්වයෙන් අසමත්වී තිබුණු නමුත් 2018 මාර්තු 30 දින වන විටත් එහි පිරිවැය රු.796,710 ක් හා සියයට 25 ක් වූ රු.199,177 ක දඩ මුදල සැපයුම්කරුගෙන් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv) ඖෂධ ඒකක 60,000 ක් වෙනුවෙන් යථෝක්ත ඇණවුම ලබාදීමෙන් දින 03 කට පසුව මෙම ඖෂධයෙන් තවත් ඒකක 60,000 කට නව ඇණවුමක් වෙනත් සැපයුම්කරුවකු වෙත ඉදිරිපත් කරමින් 2016 ජනවාරි 05 දින වන විට මිලදී ගෙන තිබුණි. 2016 ජනවාරි 31 දින වන විට ඒකක 74,370 ක් ගබඩාවේ ඉතිරිව පැවති අතර සාමාන්‍ය මාසික අලෙවි ප්‍රමාණය ඉක්මවා තොග මිලදී ගැනීම හේතුවෙන් පළමු සැපයුම්කරුගෙන් මිලදී ගත් ඒකක 27,347 ක්ද දෙවන සැපයුම්කරුගෙන් මිලදී ගත් ඒකක 501 ක් ද ඇතුලුව ඖෂධ ඒකක 27,848 ක් 2017 දෙසැම්බර් 31 දින වන විට කල්ඉකුත්වී තිබුණි. ඖෂධ කල්ඉකුත්වීම හේතුවෙන් සංස්ථාවට සිදුව තිබුණු මුළු අලාභය රු.14,827,925 ක් විය.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දින වන විට පුරප්පාඩු සේවක සංඛ්‍යාව 145 ක් විය. එම පුරප්පාඩු තුළ ඇතුළත් අනුමත කාර්ය මණ්ඩලයට අයත් විධායක මට්ටමේ තනතුරු 07 ක් හා විධායක නොවන මට්ටමේ තනතුරු 11 ක් සඳහා ස්ථිර පදනමින් බඳවා නොගෙන වැඩ බැලීමේ පදනම මත හෝ වැඩ ආවරණය කිරීමේ පදනම මත වෙනත් තනතුරුවල සිටින නිලධාරීන් 18 දෙනෙකු පත්කර තිබුණි. නිලධාරීන් ස්ථිර පදනමින් බඳවාගත හැකි අවස්ථාවන්හි දී එසේ බඳවා නොගැනීම තුළින් එම තනතුරු සඳහා සුදුසුකම් සපුරා සිටින සංස්ථා නිලධාරීන්ට එම තනතුරට පත්වීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි.

(ආ) අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා තනතුරු 15 ක් සඳහා නිලධාරීන් 12 දෙනෙකු ස්ථිර පදනමින් හා නිලධාරීන් 03 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණි.

(ඇ) අනුමත කාර්ය මණ්ඩලය තුළ නොපවතින කළමනාකරු (ව්‍යාපාර සම්පත් සැලසුම්කරණ) යන තනතුර සඳහා වර්ෂ 05 ක සිටද නියෝජ්‍ය කළමනාකරු (නඩත්තු හා ඉදිකිරීම්) තනතුර සඳහා මාස 06 ක සිටද කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 02 දෙනෙකු බඳවාගෙන තිබුණි.

(ඈ) ස්ථිර තනතුරක් වූ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන) තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරියෙකු බඳවා ගැනීමට 2017 අප්‍රේල් 28 දින පුවත්පත් දැන්වීමක් මගින් ප්‍රසිද්ධ කර අයදුම්පත් කැඳවා විශ්‍රාමික නිලධාරියෙකු එම තනතුර සඳහා බඳවා ගෙන තිබුණි. මෙම තනතුරට අදාළ බඳවා ගැනීමේ පරිපාටිය අනුව, කළමනාකරණ මට්ටමේ I ශ්‍රේණියේ මානව සම්පත් හා පරිපාලන ක්ෂේත්‍රයට අදාළව අවම වශයෙන් වර්ෂ 5 ක ස්ථිර තනතුරක සංස්ථාවේ සේවයෙහි නිරත අයට මෙම තනතුර සඳහා අයදුම් කළ හැකි වුවද, පළ කරන ලද පුවත්පත් දැන්වීමේ එම සුදුසුකම් ඇතුළත් කර නොතිබීම හේතුවෙන් එම සුදුසුකම් සම්පූර්ණ කළ සංස්ථාවේ ස්ථිර නිලධාරීන්ට අයදුම් කිරීමට නොහැකි වී තිබුණි. තවද මෙම වාර්තාවේ දින වන විටත් මෙම තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2017 ජුනි 05 දින සිට පුරප්පාඩු වී පැවතුනු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තාක්ෂණ රසායනාගාර හා නිෂ්පාදන) තනතුර සඳහා බඳවා ගැනීමට 2017 ජනවාරි 29 දින පුවත්පත් දැන්වීමක් මඟින් අයදුම්පත් කැඳවා තිබුණද, අදාළ සුදුසුකම් නොමැතිවීම, සම්මුඛ පරීක්ෂණයේදී අසමත් වීම ආදී හේතූන් මත කිසිදු අයදුම්කරුවකු තෝරා ගෙන නොතිබුණි. එදින සිට විගණිත දිනය වූ 2018 අප්‍රේල් 10 දින වනවිට මාස 11 ක කාලයක් ගතවී තිබුණද නැවත අයදුම්පත් කැඳවීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) ප්‍රවර්ධන හා ප්‍රචාරණ නිලධාරී තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා සංස්ථාව විසින් පළකර තිබුණු පුවත්පත් දැන්වීමකට අනුව අයදුම්පත් 191 ක් ලැබී තිබුණු අතර ඉන් සුදුසුකම් සැපිරූ අයදුම්කරුවන් 32 දෙනෙකු වෙනුවෙන් ප්‍රථම හා දෙවන සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබුණි. දෙවන සම්මුඛ පරීක්ෂණයෙන් පසු මෙම තනතුර සඳහා ඖෂධ හා වෛද්‍ය උපකරණ සම්බන්ධයෙන් දැනුමක් තිබිය යුතු බවටත් දැනට පවතින බඳවා ගැනීම් පරිපාටියේ ඇතුළත් බඳවා ගැනීමේ සුදුසුකම් සංශෝධනය කළ යුතු බවටත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයකු වූ විසින් නිර්දේශ කර තිබුණි. එහෙත් අදාළ බඳවා ගැනීම් පරිපාටිය සංශෝධනය කිරීමකින් තොරව හා අපේක්ෂිත සුදුසුකම් ඇතුළත් කිරීමකින් තොරව අවස්ථා 3 කදී පුවත්පත් දැන්වීම් පළ කර තිබූ අතර මෙම වාර්තාවේ දිනය වන විටත් අදාළ සුදුසුකම් සහිත නිලධාරියෙක් බඳවා ගැනීමට නොහැකි වී තිබුණි.

(උ) තාක්ෂණික නිලධාරී (නඩත්තු හා ඉදිකිරීම්) තනතුර සඳහා 2017 මැයි මස 21 දින පුවත්පත් දැන්වීම් පළ කර තිබුණු අතර ඒ සඳහා අයදුම්කරුවන් 19 දෙනෙක් අයදුම්කර තිබුණි. එම අයදුම්කරුවන්ගෙන් කිසිදු අයදුම්කරුවකු සුදුසුකම් ලබා නොතිබුණු බැවින් බඳවා නොගත් බව විගණනය වෙත දන්වා තිබුණද අයදුම්කරුවන් දෙදෙනෙකු අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබුණු බව ඒ සම්බන්ධයෙන් සිදුකළ විගණනයේදී අනාවරණය විය. මෙම වාර්තාවේ දිනය වන විටත් මෙම තනතුර සඳහා නිලධාරියෙකු බඳවා ගැනීමට අපොහොසත් වී තිබුණි.

**4.5 සේවක පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදලක් ගොඩනැගීම**

---

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 ප්‍රකාරව, අනාගත වගකීම් ඇතිවීමේ අවදානම අවම කර ගැනීම සඳහා විශ්‍රාමික පාරිතෝෂික බැඳියාව සම්බන්ධයෙන් ආයෝජන සැලැස්මක් ඇති කර ගැනීම ධෛර්යමත් කර තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**5. තිරසර සංවර්ධනය**

---

**5.1 තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

---

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සංස්ථාව විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

---------------------------------------

### 6.1 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

------------------------------------------

#### 6.1.1 ප්‍රසම්පාදනයන්

---------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ අලෙවිය සඳහා මිලදී ගන්නා වෛද්‍ය සැපයුම් හා වෙනත් වත්කම් මිලදී ගැනීම් සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කර නොතිබුණි.

(ආ) සංස්ථාව විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කරමින් සමාලෝචිත වර්ෂයේදී රු.1,236,200 ක් පිරිවැය වූ ඡායා පිටපත් යන්ත්‍ර 05ක්, රු.1,605,400 ක් පිරිවැය වූ Fume Hood උපකරණ 02 ක්, රු.860,131ක් පිරිවැය වූ පාවහන් යුගල 505 ක්, රු.475,886 ක් පිරිවැය වූ නාම පුවරු 04 ක්, රු.2,695,163 ක් පිරිවැය වූ තාප කඩදාසි රෝල් 61,000 ක්, රු.1,477,975 ක් පිරිවැය වූ Automatic Titrator යන්ත්‍රයක් හා රු.830,000 ක් පිරිවැය වූ ශීතකරණ 02ක් මිලදී ගෙන තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, සම්මත ලංසු කැඳවීමේ ලේඛනවල යෝග්‍ය ආදර්ශකයක් භාවිතා කර නොතිබුණු අතර 8.9.1 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව, විධිමත් ගිවිසුම්වලට එළඹී නොතිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව, ඡායා පිටපත් යන්ත්‍ර 05 සම්බන්ධයෙන් කාර්ය සාධන සුරක්ෂණයක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. අවම ලංසුව ඉදිරිපත් කළ ලංසුකරු වාර්ෂික සේවා හා නඩත්තු පිරිවැය (Annual Cost of Service and Maintenance ) ඉදිරිපත් කර නොතිබුණු නමුත් ඒ පිළිබඳව නොසළකා වාර්ෂික සේවා හා නඩත්තු පිරිවැය සංසන්දනාත්මකව ඇගයීමකින් තොරව මූලික පිරිවැය සැසඳීම තුළින් පමණක් අවම ලංසුව ඉදිරිපත් කළ ලංසුකරු ජයග්‍රාහී ලංසුකරු ලෙස තෝරාගෙන තිබුණි.

(iii) විධිමත් ගිවිසුම්වලට එළඹී නොතිබීම හා ප්‍රමාද ගාස්තු අයකර ගැනීමේ කොන්දේසි ලංසු ලේඛණවල හෝ ඇතුළත් කර නොතිබීම හේතුවෙන් සැපයුම්කරුගෙන් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(iv) ඡායා පිටපත් යන්ත්‍ර 05 සහ Automatic Titrator යන්ත්‍රය සැපයීම (Supply) සඳහා ලංසු කැඳවීමේදී එම යන්ත්‍ර නඩත්තු හා සේවා කිරීම (Maintenance and Services ) යන සේවාවන් ලංසු කැඳවීමේ ලේඛණවලට ඇතුළත් නොකිරීම නිසා අදාළ සමාගම ඉදිරිපත් කරන ඕනෑම ගාස්තුවක් යටතේ නඩත්තු හා සේවා කිරීම ඉටුකර ගැනීමට සිදුවී තිබුණි.

(v) අනුරාධපුර ඔසුසල වෙනුවෙන් නාම පුවරු සැපයීම සහ සවිකිරීමේ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 4.3.1 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව, සියලුම ආශ්‍රිත වියදම් ඇතුළුව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි. ඊට අමතරව කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගැනීමට, නාම පුවරුවල ආලෝකය සහ සවිකිරීම් සම්බන්ධයෙන් වගකීම් සහතිකයක් ලබාගැනීමට හා නාම පුවරු සැපයීමට පෙර සැපයුම්කරු විසින් ඉදිරිපත් කරන නිර්මාණ වැඩ (Art Works) සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ හා ප්‍රසම්පාදන කමිටුවේ පූර්ව අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) Tolbutamide Tablets BP/USP 500mg ඖෂධයෙන් ඒකක 15,000 ක් මිලදී ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මෙම ඖෂධ ඒකක 15,000 ක් සපයා ගැනීම සඳහා 2014 පෙබරවාරි 26 දින ලංසු කැඳවා තිබුණු අතර, ඒ සඳහා අවම ලංසුව ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරු ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කර නොතිබුණු හෙයින් දෙවන අවම ලංසුව ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට තීරණය කර තිබුණි. දෙවන අවම ලංසුව ඉදිරිපත් කරන ලද ලංසුකරු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ බව දන්වා ප්‍රතිග්‍රහණ ලිපියක් යවා තිබුණද, ලංසුකරු විසින් එය ප්‍රතිග්‍රහණය කර නොතිබුණි. ඒ අනුව එම ලංසුකරුගේ රු.400,000 ක ලංසු සුරක්ෂණය මුදල් කර ගත යුතුව තිබියදී ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර 2014 ඔක්තෝබර් 22 දින ලංසු සුරක්ෂණය කල් ඉකුත්වී තිබුණි.

(ii) දෙවන අවම ලංසුකරු වෙත ප්‍රදානය කළ කොන්ත්‍රාත්තුව ප්‍රතිග්‍රහණය නොකළ බැවින්, ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ප්‍රතික්ෂේපිත අවම ලංසුකරු වෙත රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8.4 වගන්තියට පටහැනිව 2015 අගෝස්තු 20 දින කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. ලංසු ලේඛණවල සඳහන් කොන්දේසි ප්‍රකාරව, කොන්ත්‍රාත්තුව පිරිනැමූ දින වන විටද, එම ලංසුකරු ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචියද ලබාගෙන නොතිබුණි.

(iii) මෙම ඖෂධයේ අවශ්‍යතාවය අනුව, 2014 නොවැම්බර් වන විට මුලු පිරිවැය රු.11,049,640 ක් වූ ඖෂධ ඒකක 9,500 ක් සංස්ථාව වෙත සපයාගත යුතුව තිබුණු නමුත්, ප්‍රසම්පාදන ක්‍රියාපරිපාටිය සඳහා 2014 පෙබරවාරි 26 දින සිට 2015 අගෝස්තු 20 දින දක්වා මාස 17 කට අධික කාලයක් ගත කර තිබුණු බැවින් ඖෂධ තොගය සංස්ථාව වෙත ලැබී තිබුණේ 2016 ජනවාරි 05 දින දීය. ඖෂධ සපයා ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් 2015 ජුනි සිට 2016 ජනවාරි 05 දින දක්වා වූ මාස 07 ක කාලය තුළ ඖෂධ තොග අවසන් වී තිබුණි. ප්‍රසම්පාදන ක්‍රියාපරිපාටිය සඳහා අධික කාලයක් ගත කර තිබීම හේතුවෙන් ඖෂධයේ අලෙවිය පැවති කාලයේදී ඖෂධය සපයා නොගැනීම නිසාත් ඖෂධ අලෙවිය අඩු කාලයේදී ප්‍රමාණය ඉක්මවා සපයා ගෙන තිබීම නිසාත් පිරිවැය රු.700,308 ක් වූ ඒකක 560 ක් කල් ඉකුත් වී තිබුණි. මීට අමතරව පිරිවැය රු.195,086 ක් වූ ඒකක 156 ක් තත්ත්වයෙන් අසමත් වී තිබුණු අතර සංස්ථාවට සිදුව තිබුණු අලාභය රු.895,394 ක් විය. ඉන් රු.320,458 ක් පමණක් 2018 වර්ෂය තුළදී සැපයුම්කරුගෙන් අයකර ගෙන තිබුණි.

(ඇ) Formoterol Fumarate and Budesonide Dry Powder Capsules (Foracort – DP Caps 400) ඖෂධයෙන් ඒකක 30,000ක් මිලදී ගැනීම සඳහා සැපයුම්කරු සමඟ එළඹ තිබුණු ගිවිසුම ප්‍රකාරව, රු.20,255,000 ක ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**6.1.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් වටිනාකම රු.106,305,300 ක් වූ කොළඹ 07 රාජ්‍ය ඔසුසලෙහි නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව පිළිබඳ පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 (ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව, කොන්ත්‍රාත්තුවේ පශ්චාත් කටයුතු සඳහා හදිසි අවිනිශ්චිත ප්‍රතිපාදන (Contingency Provision) මුලු පිරිවැය ඇස්තමේන්තුවට ඇතුළත් කර නොතිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 මාර්ගෝපදේශය ප්‍රකාරව, කොන්ත්‍රාත්කරු විසින් ලබාදී තිබුණු කාර්යසාධන සුරක්ෂණය 2016 පෙබරවාරි 24 දින කල් ඉකුත්වී තිබුණු නමුත් 2018 අප්‍රේල් 19 දින වන විටත් ඉදිකිරීම් අවසන්වී නොතිබුණු බැවින් කාර්යසාධන සුරක්ෂණයේ වලංගු කාලය දීර්ඝ කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) ප්‍රසම්පාදන කමිටු අනුමැතියකින් තොරව ඉටුකරවා ගෙන තිබුණු අතිරේක වැඩ වෙනුවෙන් රු.6,824,841 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු අතර එම වැඩ සම්පූර්ණ කිරීම සඳහා තවදුරටත් දැරිය යුතු රු.15,652,564 ක්ද ඇතුළත්ව අනුමත නොවූ අතිරේක වැඩවල මුළු පිරිවැය රු.22,477,405 ක් විය. අනුමැතියකින් තොරව අතිරේක වැඩ සිදුකිරීම හා අතිරේක වැඩ වෙනුවෙන් අවශ්‍ය ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් 2016 ජනවාරි 26 දින සිට ඉදිකිරීම් කටයුතු නතර කර තිබුණි.

(iv) කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව, ඉදිකිරීම් කටයුතු 2015 ජනවාරි 29 දින වන විට අවසන් කළ යුතු වුවත් 2018 අප්‍රේල් 19 දින වන විටත් රු.21,283,641 ක් වූ කොන්ත්‍රාත් වටිනාකමක් සහිත නිම නොකරන ලද වැඩ, අර්ධ වශයෙන් නිම කරන ලද වැඩ හා අතිරේක වැඩ නිම කරවා ගැනීමට අපොහොසත්වී තිබුණු අතර ප්‍රමාද කාලය වර්ෂ 03 කට අධික විය.

(v) වැඩ නිමකර නොතිබුණු ගොඩනැගිල්ලෙහි කොන්ත්‍රාත් වටිනාකම රු.4,010,742 ක් වූ අවශ්‍ය පිරිවිතරයන්ට අනුකූල නොවන විදුලි සෝපානයක් සවිකර තිබුණු අතර ගොඩනැගිල්ලේ සවිකර තිබුණු වායුසමීකරණ යන්ත්‍ර 24 ක් වෙනුවෙන් රු.5,732,000 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු නමුත් එම යන්ත්‍රවල වගකීම් කාලය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) ඔසුසැලක් සඳහා රු.6,872,500 ක් වටිනා විදුලිජනක යන්ත්‍රයක් ප්‍රසම්පාදනය කිරීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.1.4, 6.3.3, 6.3.6, හා 5.3.11 යන මාර්ගෝපදේශ ප්‍රකාරව පිළිවෙලින් ලංසු කැඳවීමේ ලේඛන නිකුත් කිරීමට අදාළව වාර්තාවක් තබාගැනීමට, ලංසු විවෘත කිරීමේ කමිටුවක් පත් කිරීමට හා ලංසු විවෘත කිරීම පිළිබඳ කටයුතු නියමිත ආකෘති පත්‍රයක වාර්තා කිරීමට කටයුතු කර නොතිබුණු අතර ලබා ගෙන තිබුණු ලංසු සුරක්ෂණය 2016 සැප්තැම්බර් 06 දින කල් ඉකුත්වීමෙන් පසුව ප්‍රසම්පාදන ක්‍රියාවලියේ සියලුම කාර්යයන් ආරම්භ කර තිබුණි.

## 6.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2016 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව 2018 ජුනි 20 වන දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණු අතර 2017 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන සමඟ එම වර්ෂය වෙනුවෙන් පිළියෙල කළ වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලනයේ අඩුපාඩු වරින් වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන්හි දුර්වලතා කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ඔසුසැල්වල මෙහෙයුම් පාලනය | අලාභවලට හේතු සොයා බලා අලාභ අවම කර ගැනීමට ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබීම. |
| (ආ) කාර්ය මණ්ඩල කළමනාකරණය | පුරප්පාඩු විධිමත්ව පිරවීමට කටයුතු නොකිරීම. |